දුම්රිය
புகையிரத
Railway — GMF 35

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு)
Telephone
*E- mail*: gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office — 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax — 2446490

මගේ අංකය
எனது இல
My No. — GMR/Media/06/18/2026

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ.පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர்
அலுவலகம்
த. பெ. 355இ ஒல்கொட்
மாவத்தை
கொழும்பு 10

General Manager's Office,
P.O. Box 355, Olcott Mawatha,
Colombo 10.

# ශ්‍රී ලංකා දුම්රිය සේවය
# இலங்கை புகையிரத சேவை
# SRI LANKA RAILWAYS

දිනය
தேதி
Date — 2026/06/18

ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

**<u>"දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වූ අඹේවෙල - නානුඔය අතර මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කර දුම්රිය බදුල්ල සිට නානුඔය දක්වා ධාවනය ආරම්භ කිරීම.</u>**

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් අඹේවෙල - නානුඔය අතර දුම්රිය මාර්ගයේ සැතපුම් 134 දම්වැල් 78 ප්‍රදේශයේදී දුම්රිය මාර්ගය අඩි 65 ක් ගැඹුරට, අඩි 100 පළලට සහ අඩි 120 දුරට සේදී යාම සිදුවිය.කඳු බෑවුම් සහිත තත්වය ,එම ප්‍රදේශයට ළඟාවීම සඳහා විකල්ප සැපයුම් මාර්ග නොමැතිවීම, පවතින අයහපත් දේශගුණික තත්වය හා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය දුම්රිය මගින්ම ප්‍රවාහනය කිරීමට සිදුවීම යන අභියෝග මධ්‍යයයේ සියළු ප්‍රතිසංස්කරණ කටයුතු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමග එක්ව දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුව විසින් සිදුකර මාර්ගය ධාවනයට සුදුසු තත්වයට මේ වනවිට පත්කර ඇත.

ඒ අනුව මෙතෙක් බදුල්ල සිට අඹේවෙල දක්වා ධාවනය කල දුම්රිය ධාවනය, දෙස් විදෙස් සංචාරකයින් අතර ආකර්ෂණීය දුම්රිය ස්ථානයක් වන නානුඔය දුම්රිය ස්ථානය දක්වා 2026/06/20 දින සිට පහත පරිදි ධාවනය කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

[1] 1005/1006 විශේෂ දුම්රිය

| නානුඔය/ බදුල්ල (1005)<br>**දිනපතා ධාවනය වේ.** | | බදුල්ල/ නානුඔය (1006)<br>**දිනපතා ධාවනය වේ.** | |
|---|---|---|---|
| දුම්රිය ස්ථානය | පිටත්වන වෙලාව | දුම්රිය ස්ථානය | පිටත්වන වෙලාව |
| නානුඔය | පෙ.ව. 09.00 | බදුල්ල | ප.ව.03.00 |
| අඹේවෙල | පෙ.ව. 09.30 | දෙමෝදර | ප.ව.03.37 |
| පට්ටිපොළ | පෙ.ව. 09.38 | ඇල්ල | ප.ව.03.52 |
| ඔහිය | පෙ.ව. 09.53 | බණ්ඩාරවෙල | ප.ව.04.23 |
| ඉදල්ගස්හින්න | පෙ.ව. 10.12 | දියතලාව | ප.ව.04.37 |
| හපුතලේ | පෙ.ව. 10.28 | හපුතලේ | ප.ව.04.49 |
| දියතලාව | පෙ.ව. 10.40 | ඉදල්ගස්හින්න | ප.ව.05.05 |
| බණ්ඩාරවෙල | පෙ.ව. 10.56 | ඔහිය | ප.ව.05.24 |
| ඇල්ල | පෙ.ව. 11.27 | පට්ටිපොළ | ප.ව.05.39 |
| දෙමෝදර | පෙ.ව. 11.41 | අඹේවෙල | ප.ව.05.47 |
| බදුල්ල | ප.ව. 12.16 | නානුඔය | ප.ව.06.06 |

[2] 1015/1016 විශේෂ දුම්රිය

| නානුඔය/ බදුල්ල (1015)<br>**බදාදා දින ධාවනය නොවේ.** | | බදුල්ල/ නානුඔය (1016)<br>**බදාදා දින ධාවනය නොවේ.** | |
|---|---|---|---|
| දුම්රිය ස්ථානය | පිටත්වන වෙලාව | දුම්රිය ස්ථානය | පිටත්වන වෙලාව |
| නානුඔය | ප.ව.02.30 | බදුල්ල | පෙ.ව. 09.00 |
| අඹේවෙල | ප.ව.03.00 | දෙමෝදර | පෙ.ව. 09.37 |
| පට්ටිපොළ | ප.ව.03.08 | ඇල්ල | පෙ.ව. 09.52 |
| ඔහිය | ප.ව.03.23 | බණ්ඩාරවෙල | පෙ.ව. 10.23 |
| ඉදල්ගස්හින්න | ප.ව.03.42 | දියතලාව | පෙ.ව. 10.37 |
| හපුතලේ | ප.ව.03.58 | හපුතලේ | පෙ.ව. 10.49 |
| දියතලාව | ප.ව.04.10 | ඉදල්ගස්හින්න | පෙ.ව. 11.05 |
| බණ්ඩාරවෙල | ප.ව.04.26 | ඔහිය | පෙ.ව. 11.24 |
| ඇල්ල | ප.ව.04.57 | පට්ටිපොළ | පෙ.ව. 11.39 |
| දෙමෝදර | ප.ව.05.11 | අඹේවෙල | පෙ.ව. 11.47 |
| බදුල්ල | ප.ව.05.46 | නානුඔය | ප.ව. 12.16 |

[3] 1043/1044 ඇල්ල ODYSSEY විශේෂ දුම්රිය

| නානුඔය/ බදුල්ල (1043)<br>**බදාදා දින පමණක් ධාවනය වේ.** | | බදුල්ල/ නානුඔය (1044)<br>**බදාදා දින පමණක් ධාවනය වේ.** | |
|---|---|---|---|
| දුම්රිය ස්ථානය | පිටත්වන වෙලාව | දුම්රිය ස්ථානය | පිටත්වන වෙලාව |
| නානුඔය | ප.ව.01.00 | බදුල්ල | පෙ.ව. 07.45 |
| අඹේවෙල | ප.ව.01.32 | දෙමෝදර | පෙ.ව. 08.19 |
| පට්ටිපොළ | ප.ව.01.42 | ඇල්ල | පෙ.ව. 08.43 |
| ඔහිය | ප.ව.01.56 | බණ්ඩාරවෙල | පෙ.ව. 09.11 |
| ඉදල්ගස්හින්න | ප.ව.02.14 | දියතලාව | පෙ.ව. 09.27 |
| හපුතලේ | ප.ව.02.29 | හපුතලේ | පෙ.ව. 09.39 |
| දියතලාව | ප.ව.02.40 | ඉදල්ගස්හින්න | පෙ.ව. 10.15 |
| බණ්ඩාරවෙල | ප.ව.02.55 | ඔහිය | පෙ.ව. 10.33 |
| ඇල්ල | ප.ව.03.21 | පට්ටිපොළ | පෙ.ව. 10.47 |
| දෙමෝදර | ප.ව.03.39 | අඹේවෙල | පෙ.ව. 11.00 |
| බදුල්ල | ප.ව.04.12 | නානුඔය | පෙ.ව. 11.29 |

ඉහත සෑම දුම්රියකම, පළමු පංතියේ (වායු සමනය කල) සහ දෙවන පංතියේ ආසන වෙන්කිරීමේ පහසුකම සහිත මැදිරි පවතින අතර, https://seatreservation.railway.gov.lk යන සබැඳිය ඔස්සේ හෝ ආසන වෙන්කිරීමේ පහසුකම සලසා ඇති දුම්රිය ස්ථානයකට පැමිණීමෙන් හෝ මෙම දුම්රියන් වල ආසන වෙන්කරවා ගැනීමේ පහසුකම් සලසා ඇත.

ගමන ආරම්භක හෝ ගමන අවසාන දුම්රිය ස්ථානය ලෙස අඹේවෙල දුම්රිය ස්ථානය ලෙස සඳහන් මේ වනවිටත් ලබාගෙන ඇති වෙන්කළ ආසන ප්‍රවේශ පත්‍ර ම භාවිතා කර නානුඔය සිට ගමන් ආරම්භ කිරීමට හෝ නානුඔය දුම්රිය ස්ථානයෙන් තම ගමන අවසන් කිරීමට අවසර ඇත.

ඉහත දුම්රිය ධාවනය පිළිබඳව ජනමාධ්‍ය මගින් ජනතාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමි.

G.D.A සමරසිංහ
අධිකාරි (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට